# නිල් දියවරින් යුගයේ මධුර ගී හඬ යලිත් දිවුල්ගනේ මෙල්බන් ප්‍රසංග වේදිකාවේ "ස්වර්ණ ගී මියැසිය"

මහින්ද දිසානායක දිවුල්ගනේ



''ගීතය අතිශය භාව සූචන කලා මාධ්‍යයකි. ගීතය නම් වූ කලාව තුළ ඇති සූක්ෂමතාව එම කලාව මැනවින් සේවනය කිරීමෙන් වටහාගත යුතු වන්නේ ය. ගීතයේ විෂය ක්ෂෙත්‍රය පෙර අපර දෙදිග පෝෂණය වී ඇත්තේ විවිධ විචිත්‍ර මනෝභාව ආශ්‍රය කර ගෙනය. භාව භාෂණයම ගීතය බඳු කලාවක මුඛ්‍ය පරමාර්ථයයි. මිනිසා අත් විඳින සුඛ දුක්ඛ වේදිතයන්ගේ ප්‍රතිරාවය අපේ හදවත් වලට හෘදයාංගමව ආමන්ත්‍රණය කරවීමේ පරිණත බවක් තිබේ. එවන් ගීත සමුදායක් ශ්‍රාවකයා වෙත තිළිණ කළ දශක ගණනාවක් රසික ආදරය එක සේ දිනාගත කලාකරුවා නම් ගායන ශිල්පී කරුණාරත්න දිවුල්ගනේය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ අනුරාධපුරයට මායිම්ව පිහිටි දිවුල්ගනේ නම් සොඳුරු ගම් පියසේ උපත ලබා දිවුල්ගනේ මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනයත් ඇහැටුවැව හා කඩවත යන මහා විද්‍යාල වලින් උසස් අධ්‍යාපනයත් ලැබූ ඔහු රජරට ගුවන් විදුලි සේවයෙන් ගායකයෙක් බවට නියත විවරණ ලැබීය. ඉන්පසු විශාරද ගුණදාස කපුගේ සමඟ අගනගරය සපැමිණි ඔහු තම කලා දිවියේ නිම් වලලු පුළුල් කරමින් ශ්‍රී ලාංකීය රසික ජනතාවගේ සමාදරයට පාත්‍ර විය. එදා මෙදා තුර ඔහු ගැයූ හැම ගීතයක්ම රසික හදවත් ආදරයෙන් වැළඳගත් ගීතයක්ම විය. ගුවන් විදුලිය හා ප්‍රසංග වේදිනාවේ දිග්විජය කළ මේ කලාකරුවා ගීතයේ යෞවනයම විය.

ප්‍රේමයේ දී ප්‍රථම ප්‍රේමය වනාහි ඉතාමත් මිහිරි වේ. එය ගිලිහුණ කල්හි දැනෙන දුක්ඛ වේදනාවද ඒ තරම්ම ප්‍රබල වේ. ''ඇසට අසුවන මායිමේ'' ගීතයේ ද ප්‍රේමයේ විරහ තාපය පෙන්වා දෙයි. මේ ගීතයේ ප්‍රථම ප්‍රේමයේ මිහිරි බවත් එය බිඳ වැටෙන විට දැනෙන දුක ඉතා ප්‍රබලව ඇත්තේ සඟවාලීමෙන් මලක සුවඳ මලකට ඉතිරි වේ. කවියක අරුත කවියෙහිම ඉතිරි වේ. ප්‍රේමය වඩාත් රමණීය වන්නේ ශෘංගාරය නිසාය. මේ ශෘංගාරය හෙවත් සම්බෝග හා විප්‍රලම්භ ශෘංගාරයේදී ද හොඳ ගී නිර්මාණ වේ. වෙන් වූ දිනක ලසෝ ගිණි ඇවිලුනද ප්‍රේමය නම් අසිරිමත්ය.

මේ ''ඇසට අසු වන මායිමේ'' ගීතය එකතු කළ ගී සමුච්චයෙන් ආරම්භ කළ ගීතාවලිය ''තරු එළිය දිගේ '' දක්වා විහිදී ගියේය. ගීතය හරසුන් ඝෝෂාකාරී රැල්ලකට උඩු සුළඟට ගසා ගෙන යද්දී නෙසැලී තම නිර්මාණ ගුණ සේම පිහිටා සිටීමට තරම් උසස් ගුණයෙන්ම හෙබි කලා කරුවෙකු විය. මෙතෙක් ගීතයෙහි එතෙක් පැවැති ගතානුගතික සම්මතයන් උඩුයටිකුරු කර රැලි බිඳ දමමින් ගීතය හරවත් අර්ථ පූර්ණ රස පූර්ණ රසාලිප්තයක් බවට පත් කරලන්නට ඔහුගේ ගීත කලාව මහඟු උපකාරයක්ම විය. ප්‍රේමය, මව්පිය වරුන්,බෞද්ධ ගීත හා දේශාභිමානී ගීතද ඔහුගේ ගීතාවලියේ විවිධ මානයේ ගීත අකර වෙයි

විශේෂයෙන්ම දිවුල්ගනේ නම් මේ මහඟු කලා කරුවා ගායනය කළ සෑම ගීයක්ම පාහේ අර්ථ රසයෙන්, සාහිත්‍ය රසයෙන් මෙන්ම ගීත රසයෙන් පෝෂණය වූවා පමණක් නොව සහෘද ශ්‍රී ලාංකික රසික ජනතාව ආදරයෙන් තම හදවතට සමීප කර ගත්හ.යොදාගත් අළුත් උපමා රූපක, කාව්‍ය භාෂාව ඉදිපත් කළ අත් දැකීම්හි තිබූ නව්‍යතාව සහෘද ශ්‍රී ලාංකීය ජනතාවගේ හදවතේ ආදරයෙන් නිදන් වෙන්නට බලපෑ හේතු සාධක වේ. හොඳ ගීතයක ඇති ස්භාවය වන්නේ කාලාත්‍රයේදීම නැවුම් බවින් යුතුව විකසිත වී තිබීමයි. ඔහුගේ අනන්‍ය වූ මධුර ගී හඬ ද මේ මල විකසිත වන්නට ප්‍රලබ වූ හේතුවක් වන්නට ඇත.

ඇසට අසුවන මායිමේ ගී සංයුක්ත තැටියේ අඩංගු හැම ගීතයක්ම ''නිල් දියවර'', ''නෙතට උගුලක් '', ''සංහිඳ පාමුල'' , ''තරු එළිය දිගේ '' යන වරින් වර රසිකයන් සඳහා තිළිණ කළ මේ ගීතා වලියේ සෑම ගීතයක්ම ශ්‍රී ලාංකීය ගී පහස නිධාලන සාහිත්‍ය රසයෙන් පිරි ගී වරුසාවක් විය. හතු පිපුනාක් මෙන් රසික රසාස්වාදය හිරිහැරයක් වූ ගී බිහිවන සමයක ඉතා හෙමින් වූවක් අර්ථාන්විත මේ කලා කරුවා පැමිණි මඟ යහපත්ය.

මේ ලෝකය නිර්මණාය වී ඇත්තේ සූර්යායගෙන් මෙන්ම මවගේ කිරිවලින් බව වරක් එක්තරා දාර්ශනිකයෙක් ප්‍රකාශ කර තිබුනා. බොහෝ නිර්මාණ කරුවන් තම නිර්මාණ මව මව් ගුණ වෙනුවෙන් නිර්මාණය කරන්නට ඇත්ද. මෙතුමාගේ මධුර ගායන විලාශයෙන් ගායනා කරන ''ගමට කලින් '' ගීතය මේ දක්වා අපේ ශ්‍රී ලාංකික ගීතා වලියේ අර්ථ පුර්ණ රස පූර්ණ නැවුම් බවින් යුතු මවක සතු ගුණ කදම්භය ප්‍රකාශ කරන ගීතයම යයි කීම සක් සුදක් සේ දන්නා කරුණකි. මේ ගීතය පමණක් නොව ''පවන නිවාලූ'' වෙහෙරක් වගේ ආදී මව් ගුණ ගීතයද ඔහු ගායනා කළ සිය ගණනක් ගීත අතුරින් ස්ගීවල තිබෙන නැවුම් බව නිසාය. පියවරුන්ද තම දරුවන් වෙනුවෙන් කරන මෙහෙයද සුළුපටු නම් නොවේ මැයි ඒ ගුණ ලියවී ඇති ගීත ප්‍රමාණය අල්ප වේ. සෑම පියකුගේම ඇති ප්‍රාර්ථනාවක් නම් දරුවන් වෙනුවෙන් ඔවුන්ගේ දියුණුව ගැන දරණ වැය වෑයමයි. පියාගේ ගුණ සුවඳ ආඝ්‍රහනය කළ කෙනෙකු ලෙස අපගේ කලා කරුවා ගැමි සුවඳ ගීතයට මුහු කළ අප්පච්චී ගීතය ගීතාවලිය තුළ සදා සනිටුවහන් වේ. මේ මව් පිය ගුණ ගීත ගායනයට ඔහු සුදෙස්සකු වන්නේ ඒ දෙපල තම දෙඇසට මෙන් මියෙන තුරු රැකබලා ගත් සමාජයටද ආදර්ශයක් දුන් කලා කරුවෙක් බව මා හොඳින් දන්නා කරුණක් බැවිනි. අප්පච්චී ගීතයේ සංගීතයද අපේ හිතාදර සංගීතඥයා වූ රෝහණ ධර්මකීර්ති විමද විශේෂයකි.

ප්‍රේමය යන්නට අපි කවුරුත් සංවේදී වෙමු. අපි සෑම සියලු දෙනාම ප්‍රේමය ලබා තිබෙනවා මෙන්ම මිය යන මොහොත දක්වාම එය ලබමින් තිබෙනවාද විය හැකිය. ප්‍රේමය යන උත්තරීතර වූ සංකල්පයක්ද වේ මැයි ගායකයකුට සමාජ අසාධාරණය ගැන පමණක් ගායනා කරමින් හොඳ රසික පිරිසක් තනා ගත නොහැකිය. එමෙන්ම ගී ශ්‍රවණයේ වැඩි ඇල්මක් දක්වන්නේ තරුණ තරුණියෝ ය. ඔවුන් ප්‍රේමය ගැන දක්වන්නේ දැඩි ඇල්මකි. එහෙත් අප ප්‍රේමය ලෙස විග්‍රහ කරණ වපසරිය ඊට වඩා පුළුල් වේ. හතු පිපෙන්නාක් මෙන් බිහි වන දහසක් ගායකයන්ගේ ප්‍රධාන විශය වී ඇත්තේ යෞවන ප්‍රේමයයි. එබඳු වූ ප්‍රේම යාදිනි සතියක් ඇතුළත ජනප්‍රියව රැයෙන් දෙකෙන් සහෘද වූ මතකයෙන් ගිලිහී යයි. ගීතයකදී ගායකයාගේ හඬ, ගේය පද රචනය, සංගීතය යන ත්‍රිත්වයේම ඒකාත්මික බවෙන්ම හොඳ ගීතයක් නිර්මාණය වේ.

ඔහු වැඩි වශයෙන්ම ගායනා කොට අත්තේ අර්ථාන්විත බවෙන් යුතු ප්‍රේම ගීතය. ඒ අතරින් යමුණා මාලිනී පෙරේරා ලියු ''රෝස තොල් '' ''ගජමන් නෝනා'' මෙන්ම මහින්ද ලියු '' පින්සර'' ''නෙතට උගුලක් '' රත්න ශ්‍රී ලියූ දුරු කතර ගෙවාගෙන '' තරු එළිය දිගේ '' මහින්ද චන්ද්‍රසේකරයන්ගේ ''පාතිමා'' ආදී ගීත පමණක් නොව ඔහු ගැයූ හැම ප්‍රේම ගීතයක්ම එකසේ රසික ප්‍රසාදය දිනා ගැනීමට සමත් ගීතයයි පැවසීම අතිශෝක්තියනක් නොවේ.

එමෙන්ම ආදරේ විවධ පැතිකඩයන් විවෘත කරමින් දුවකට බැඳි පියකුගේ ආදරය විවෘත කරමින් දුවකට බැඳි ආදරය විග්‍රහ කරන '' මගේ දුවේ'' ගීතයද ඉතා ජනප්‍රිය ගීතයකි. '' ලොව දුන්නු දේවල් අද අපට හෙට ලොවට පෙරලා දිය යුතුයි '' මේ ගීතයේදී දුවකට පියකු විසින් සිහිපත් කරන සමාජ චර්යා ධර්මයන්ය. එදා එම රැගායනා කල ගී අතරම හොරු දෙමින් නවීන විද්‍යුත් මාධ්‍ය තුළ වන අර්ථවත් වූ කාලීන ගීත ගායනා තුළින් ගීතයට යෞවනය සනිටුවහන් කරන කලා කරුවෙකු වේ නම් ඒ කරුණාරත්න දිවුල්ගනේ නම් වේ මැයි.

ඔහුගේ මධුර වූ සුභානීය වූ ගී මියැසිය ''නිල් දියවර'' ගී ප්‍රසංගයයි. ඔබේත් මගේත් ආදරණීය ප්‍රවීන ගායන ශිල්පී කරුණාරත්න දිවුල්ගනේ ඉදිරිපත් කරන මේ ප්‍රසංගය ඉන්ද්‍රජිත් මිරිහාන ප්‍රමුඛ වාද්‍ය වෘන්දය සංගීතය මෙහෙයවයි. 2016 වසරේ පෙබරවාරි මස 31 සෙනසුරාදා සවස 6. 30 ට බීසන් සෙන්ටර් හීදී ඉදිරිපත් කරන යුගයේ මධුර ගී ප්‍රසංගය අජිත් මහතාගේ සංවිධානත්වයෙන් පවත්වෙයි

උසස් අස වින්දනයක් සඳහා මෙල්වින් ඔබට සුහදව කෙරෙන ආරාධනයයි.

විමසීම් - අජිත් 0421820575

# ඉතිහාසයේ දිනක මෙසේ සිදුවිය



ජාතිවාදයේ නිහීනත්වය තුලින් වැනසී ගියේ මනුෂ්‍යත්වයයි ...එය ලොවේ කොතැනක සිදු වුවද ප්‍රදර්ශනය වුයේ ගල් යුගයේ ගතානුගතිකත්වය පමණි.

1971 දී පැවැති බංග්ලාදේශ නිදහස් සටන තුල හින්දු ජාතිකත්වය හා මුස්ලිම් ජාතිකත්වය අතර හුවමාරු වූ ලේ කඳ ගංගා නදිය පවා ඉක්මවා ගියේය. පකිස්ථානය විසින් බලහත්කාරයෙන් බංග්ලාදේශය අත්පත් කරගන්නා විට එරට විසු හින්දු ජනයා සමුහ වශයෙන් ඝාතනය කරන ලදී. හින්දු ජනතාවද තම කෝපය මුදා හැරියේ මුස්ලිම් ජනයා දුටු තැන පෙති ගසා මරා දමමනි. එම තිරශ්චීන යුද්ධයෙන් කිසිවෙකුට ජය ගත නොහැකි වුවද , හැකි තරම් ජනයා ඝාතනය කිරීමට දෙරටේ හමුදාවන්ට අවස්තාවක් ලැබුණි. එම යුධමය තත්වය තුල පකිස්ථාන හමුදාව බංග්ලාදේශ හින්දු ජනයා හඳුනා ගැනීමට අපුරු උපක්‍රමයක් යොදාගත්තේය. අත්අඩංගුවට ගන්නා පිරිමින් ගේ ලිංග ඡේදනය නොහොත් සුන්නත් කිරීම පරික්ෂාවට ලක්කර මරණයද ජීවිතයද තීන්දු කළේය. මේ ඡායාරූපයේ දිස්වන්නේ පක්ස්ථාන හමුදා භටයෙකු විසින් බංග්ලාදේශ හින්දු ජාතිකයෙකුගේ ජාතිකත්වය පරික්ෂාවට ලක්කරන අයුරුයි.

චූලක බණ්ඩාරවත්ත

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com